# 13 ශ්‍රේණිය

# ආර්ථික විද්‍යාව

## නිපුණතාව 10

## විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.

# නිපුණතා මට්ටම 10.1

ගෙවුම් ශේෂ ලේඛනයේ අන්තර්ගතය විශ්ලේෂණය කරයි.

# අපේක්ෂිත ඉගෙනුම් පල

- මහ බැංකු වාර්තාව ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයේ කාලීන ආකෘතිය ඉදිරිපත් කරයි

- කල්පිත සංඛ්‍යා දත්ත ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයක ගනුදෙනු ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් කරයි.

# 13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව ගෙවුම් ශේෂ ලේඛනය



## 13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව ගෙවුම් ශේෂ ලේඛනය

| විස්තරය | රු.බිලියන | රු.බිලියන |
|---|---|---|
| භාණ්ඩ (වෙළෙඳ) ගිණුමේ ශේෂය | | -900 |
| අපනයන | 1000 | |
| ආනයන | (1900) | |
| සේවා ගිණුමේ ශේෂය | | -100 |
| සේවා ලැබීම් | 200 | |
| සේවා ගෙවීම් | (300) | |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | | -200 |
| ප්‍රාථමික ආදායම් ලැබීම් | 200 | |
| ප්‍රාථමික ආදායම් ගෙවීම් | (400) | |
| ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය | | 700 |
| ද්විතීයික ආදායම් ලැබීම් | 900 | |
| ද්විතීයික ආදායම් ගෙවීම් | (200) | |
| ජංගම ගිණුමේ/වර්තන ගිණුමේ ශේෂය | | -600 |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | | 200 |
| ප්‍රාග්ධන ලැබීම් | 300 | |
| ප්‍රාග්ධන ගෙවීම් | 100 | |
| ජංගම ගිණුමේ හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | | -400 |
| මූල්‍ය ගිණුම | | |
| සෘජු ආයෝජන | | 100 |
| වත්කම්වල ශුද්ධ වෙනස්වීම | 300 | |
| වගකීම්වල ශුද්ධ වෙනස්වීම | -200 | |
| විවිධ ආයෝජන | | 100 |
| වත්කම්වල ශුද්ධ වෙනස්වීම | 200 | |
| වගකීම්වල ශුද්ධ වෙනස්වීම | -100 | |
| මූල්‍ය ව්‍යුත්පන්න | | 100 |
| වත්කම්වල ශුද්ධ වෙනස්වීම | 200 | |
| වගකීම්වල ශුද්ධ වෙනස්වීම | -100 | |

| | | |
|---|---|---|
| අනෙකුත් ආයෝජන | | 50 |
| වත්කම්වල ශුද්ධ වෙනස්වීම | 250 | |
| වගකීම්වල ශුද්ධ වෙනස්වීම | 200 | |
| සංචිත වත්කම් | | 40 |
| මූල්‍ය රන් | 10 | |
| විශේෂ ගැනුම් හිමිකම | 10 | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත | 5 | |
| වෙනස්වීම් | 15 | |
| අනෙකුත් සංචිත වත්කම් | 0 | |
| වැරදි හා අත්හැරීම් | | 10 |
| මූල්‍ය ගිණුමේ ශේෂය | | 400 |

# ගෙවුම් ශේෂ ලේඛනය තුලනය වීම

- ගෙවුම් ශේෂ ලේඛනයේ සියලුම ගනුදෙනු ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් කරන නිසා ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව මූල්‍ය ගිණුමේ ශේෂයට හා ශුද්ධ වැරදීම් සහ අත්හැරීම්වල එකතුවට සමාන විය යුතු ය.

ගෙවුම් ශේෂ ලේඛනය තුලනය = ජංගම ගිණුමේ ශේෂය + ප්‍රාග්ධන ගිණුමේ ශේෂය + මූල්‍ය ගිණුමේ ශේෂය = 0

# ගෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂය

| | | | | |
|---|---|---|---|---|
| ගෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂය | = | සලකා බලන වසරේ ශුද්ධ නිල සංචිත | - | පෙර වසරේ ශුද්ධ නිල සංචිත |

සලකා බලන වසරේ ශුද්ධ නිල සංචිත = සලකා බලන වසරේ දළ නිල සංචිත - සලකා බලන වසරේ මහ බැංකුවේ විදේශ වගකීම්

පෙර වසරේ ශුද්ධ නිල සංචිත = පෙර වසරේ දළ නිල සංචිත - පෙර වසරේ මහ බැංකුවේ විදේශ වගකීම්

# Trade Balance




Source: Central Bank of Sri Lanka

# Tourism

## Arrivals and Earnings




Sources: Central Bank of Sri Lanka and Sri Lanka Tourist Development Authority (SLTDA)

## Monthly Arrivals




Source: SLTDA

# Workers' Remittances




Source: Central Bank of Sri Lanka

# Current Account Balance




Source: Central Bank of Sri Lanka

# Foreign Direct Investment Inflows




Sources: Central Bank of Sri Lanka,

# Balance of Payments




Source: Central Bank of Sri Lanka

# Gross Official Reserves




Source: Central Bank of Sri Lanka

# ගෙවුම් ශේෂ ලේඛනයේ ගනුදෙනු ද්විත්ව සටහන් මූලධර්මයට අනුව සටහන් කිරීම

- ගෙවුම් තුලන ලේඛනයක ඇතුළත් කරනු ලබන ගනුදෙනු වාර්තා කිමේ දී අනුගමනය කරනු ලබන මූලික සම්මතය වනුයේ සෑම ගනුදෙනුවක් ම එක හා සමාන වටිනාකමින් දෙතැනක සටහන් කළ යුතු වීමයි.

- සෑම ගනුදෙනුවකටම වටිනාකම හර අගයක් සහ බැර අගයක් වශයෙන් තීරු දෙකක සටහන් කළ යුතු අතර බැර වටිනාකම (+) ලකුණින් සහ හර වටිනාකම (-) ලකුණින් සටහන් කළ යුතු වේ.

- මෙලෙස ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලු ම ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක සහ හර තීරුවක සටහන් කළ විට සියලු ගනුදෙනුවල ශුද්ධ ශේෂය ශූන්‍ය අගයක් ගනී.

## 01. ඩොලර් මිලියන 200ක කුරුඳු විදේශ රටකට අලෙවි කිරීම

| | |
|---|---|
| වෙළෙඳ ගිණුම | බැර (+) 200 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර (-) 200 |

## 02. ඩොලර් මිලියන 600ක ඛණිජ තෙල් මිල දී ගැනීම

| | |
|---|---|
| වෙළෙඳ ගිණුම | හර (-) 600 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | බැර (+) 600 |

03. විදේශ නැව්වලට සේවා සැපයීම වෙනුවෙන් ඩොලර් මිලියන 50ක් ලැබීම

| | | |
|---|---|---|
| සේවා ගිණුම | බැර (+) | 50 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර (-) | 50 |

04. ශ්‍රී ලාංකික රක්ෂණ සමාගමක් විදේශිකයෙකුට ඩොලර් මිලියන 100ක රක්ෂණ වන්දියක් ගෙවීම

| | | |
|---|---|---|
| සේවා ගිණුම | හර (-) | 100 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන | බැර (+) | 50 |

05. ශ්‍රී ලංකාවේ විදේශීය රටවලින් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොලිය මිලියන 500ක් ගෙවීම

ප්‍රාථමික ආදායම් ගිණුම හර (-) 500

මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන බැර (+) 500

05. ශ්‍රී ලංකාවේ විදේශීය රටවලින් ලබා ගත් ණය සඳහා වාරික මිලියන 500ක් ගෙවීම

මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන

(බැංකු තැන්පතුව) හර (+) 500

මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන

(රාජ්‍ය ණය ගිණුම) බැර (-) 500

06. ශ්‍රී ලාංකික නාමල් බංගලාදේශ ඇඟළුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 400ක් ලාභාංශ ලැබීම

| | | |
|---|---|---|
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර | (-) 400 |
| ප්‍රාථමික ආදායම් ගිණුම | බැර | (+) 400 |

07. USA සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙක් වන බැසිල් ඩො.මිලි 100ක ආමුඛ ප්‍රේෂණ එවීම

| | | |
|---|---|---|
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර | (-) 100 |
| ද්විතීයික ආදායම් ගිණුම | බැර | (+) 100 |

08. USA පුරවැසියෙක් වන බැසිල් තම ඥාතීන් වෙත මිලියන 150ක ප්‍රේෂණ USA බැංකුවක් වෙත යැවීම

| | | |
|---|---|---|
| ද්විතීයික ආදායම් ගිණුම | හර | (-) 150 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන | බැර | (+) 150 |

09. චීන රජය ඩො.මිලි 100ක් වටිනා Sinopharm තොගයක් ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග කිරීම

| | |
|---|---|
| වෙළෙඳ ගිණුම | හර (-) 100 |
| ද්විතීයික ආදායම් ගිණුම | බැර (+) 100 |

10. ශ්‍රී ලංකා රජය පකිස්ථාන රජයට ඩො.මිලි 150ක් වටිනා ඖෂධ තොගයක් පරිත්‍යාග කිරීම

| | |
|---|---|
| ද්විතීයික ආදායම් ගිණුම | හර (-) 150 |
| වෙළෙඳ ගිණුම | (+) 150 |

11. ඩො.මිලි 5000ක් වටිනා බස් රථ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග ලෙස ලැබීම

| | |
|---|---|
| වෙළෙඳ ගිණුම | හර (-) 5000 |
| ප්‍රාග්ධන ගිණුම | බැර (+) 5000 |

12. ශ්‍රී ලංකාවේ සමාගමක් ඉන්දියානු සමාගමක වෙළෙඳ නාමය මිලට ගෙන ඩො.මිලි 1000ක් ගෙවීම

| | |
|---|---|
| ප්‍රාග්ධන ගිණුම | හර (-) 1000 |
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | බැර(+) 1000 |

13. ශ්‍රී ලංකා රජය විදේශ මූල්‍ය වෙළෙඳ පොළේ ඩො.මිලි.1000ක ස්වෛරීත්ව බැඳුම්කර අලෙවි කිරීම

| | |
|---|---|
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර (-) 1000 |
| මූල්‍ය ගිණුමේ කළඹ ආයෝජන (ණය සුරැකුම් පත්) | බැර (+) 1000 |

14. විදේශ ආයෝජකයෙක් ශ්‍රී ලංකාව තුළ ඩො.මිලි 500ක් යොදවා කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම

| | |
|---|---|
| මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන | හර (-) 500 |
| මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන | බැර (+) 500 |

15. ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩො.මිලි. 1000ක ණය මුදලක් ගැනීම
මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන (බැංකු තැන්පතුව) හර (-) 1000
මූල්‍ය ගිණුමේ අනෙකුත් අයෝජන (රාජ්‍ය ණය ගිණුම) බැර (+) 1000

16. ආණ්ඩුව විදේශවලින් ලබා ගත් ණය සඳහා ඩො.මි. 70ක් ණය පොලිය ගෙවීම
ප්‍රාථමික ආදායම් ගිණුම හර (-) 70
මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන බැර (+) 70

17. මහ බැංකුව ඩො.මිලි 100ක් වටිනා මූලය රන් මිලදී ගැනීම

මූල්‍ය ගිණුමේ සංචිත වත්කම් හර (-) 100

මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන බැර(+)100

18. ශ්‍රී ලංකා මහ බැංකුව මූලය නොවන රන් ඩො.මිලි. 200ක් මිලදී ගැනීම

වෙළෙඳ ගිණුම හර (-) 200

මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන බැර (+)200

# Thank You